// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1837/8 - 2013 නොවැම්බර් මස 19 වැනි අඟහරුවාදා - 2013.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1684/18 දරණ හා 2010.12.14 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරණ ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන හෙද සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2013. නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 10,
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
සෞඛ්‍ය අමාත්‍යංශයේ දී ය.

සෞඛ්‍ය අමාත්‍යාංශය

*ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය*

01. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර :

1.1 පත් කිරීම් බලධරයා -

| | |
|---|---|
| (අ) ශ්‍රී ලංකා හෙද සේවයේ III, II, I ශ්‍රේණි හා අධි ශ්‍රේණිය - | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් |


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ශ්‍රී ලංකා හෙද සේවයේ විශේෂ ශ්‍රේණිය - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ඇ) ශ්‍රී ලංකා හෙද සේවයේ විධායක ශ්‍රේණිය - රාජ්‍ය සේවා කොමිෂන් සභාව

02.සේවා ගණය පිළිබඳ විස්තර :

2.1 සේවා ගණය - (අ) ශ්‍රී ලංකා හෙද සේවයේ නිළධාරින්
(ආ) ශ්‍රී ලංකා හෙද සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරින්
(ඇ) ශ්‍රී ලංකා හෙද සේවයේ විධායක ශ්‍රේණියේ නිළධාරින්

2.2 ශ්‍රේණි

(අ) ශ්‍රී ලංකා හෙද සේවය
III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය
අධි ශ්‍රේණිය

(ආ) ශ්‍රී ලංකා හෙද සේවාවේ විශේෂ ශ්‍රේණිය

(ඇ) ශ්‍රී ලංකා හෙද සේවාවේ විධායක ශ්‍රේණිය

2.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

රෝග නිවාරණය, සෞඛ්‍ය අභිවර්ධනය, වේදනාවන්ගෙන් මුදවා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ කාර්ය කිරීම පිණිස, මූලික මිනිස් අවශ්‍යතා හඳුනාගනිමින්, විද්‍යාත්මක මූලධර්ම පදනම්ව, රෝගී සත්කාර (රෝහල් හා සායන) සේවා, ප්‍රජා/මානසික හෙද සේවා, හෙද අධ්‍යාපන සේවා හා විශේෂිත/පර්යේෂණ හෙද සේවා යන ක්ෂේත්‍රයන්හි මනා ක්‍රියාකාරීත්වය සඳහා ඉවහල් වන්නා වූ, සුවිශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන් ද, උපකාරක හෝ පහසුකාරක කාර්යයන්ගෙන් ද සමන්විත වන්නා වූ කාර්යාවලියකි.

03. තනතුරේ ස්වභාවය - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

04. වැටුප් :

4.1 වැටුප් කේත අංකය -

(අ) III, II, I හා අධි ශ්‍රේණිය - - MT 7 - 2006 - A
(ආ) විශ්‍රේෂ ශ්‍රේණිය - MT 8 - 2006 - A
(ඇ) විධායක ශ්‍රේණිය - SL-1-2006

4.2 වැටුප් පරිමාණය

(අ) රු. 15,620 - 4 X 180 - 6 X 240 - 11 X 320 - 20 X 360 - රු. 28,500
(ආ) රු. 24,180 - 10 X 650 - 8 X 790 - රු.37,000
(ඇ) රු. 22,935-10x645-8x790-17x1050-රු. 53,555/-

4.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| *ශ්‍රේණිය* | *වැටුප් පියවර* | *වැටුප් තලය රු.* |
|---|---|---|
| III | MT 7 - 2006 - A හි පියවර 01 | 15,620 |
| II | MT 7 - 2006 - A හි පියවර 12 | 18,100 |
| I | MT 7 - 2006 - A හි පියවර 23 | 21,660 |
| අධි ශ්‍රේණිය | MT 7 - 2006 - A හි පියවර 34 | 25,620 |
| විශේෂ | MT 8 - 2006 -A හි පියවර 04 | 26,130 |
| විධායක | SL-1-2006 හි පියවර 01 | 22,935 |

සටහන - පුහුණු කාල සීමාව තුළදී පළමු වර්ෂයේදී මාසිකව රු. 12,920ක දීමනාවක්ද, දෙවන වර්ෂයේදී මාසිකව රු. 13,040ක් සහ තුන්වන වර්ෂයේ සිට මාසිකව රු. 13,160ක දීමනාවක් ද ලබාදෙනු ඇත. පුහුණුව අවසානයේ හෙද සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේදී එම ශ්‍රේණියට නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ. (කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව මෙම දීමනා වෙනස් විය හැක.)

05. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

5.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| *අනුමත තනතුරු නාම* | *තනතුරු අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| මාණ්ඩලික හෙද | ශ්‍රී ලංකා හෙද සේවය- III, II, I හා අධි ශ්‍රේණිය | 20105 |
| මාණ්ඩලික හෙද I ශ්‍රේණිය (රෝහල් සේවා) | ශ්‍රී ලංකා හෙද සේවය- I ශ්‍රේණිය | 801 |
| මාණ්ඩලික හෙද I ශ්‍රේණිය (අධ්‍යාපන) | ශ්‍රී ලංකා හෙද සේවය- I ශ්‍රේණිය | 218 |
| මාණ්ඩලික හෙද I ශ්‍රේණිය ( මහජන සෞඛ්‍ය) නිලධාරිනීන් | ශ්‍රී ලංකා හෙද සේවය- I ශ්‍රේණිය | 59 |
| මාණ්ඩලික හෙද විශේෂ ශ්‍රේණිය (රෝහල් සේවා) | ශ්‍රී ලංකා හෙද සේවාවේ - විශේෂ ශ්‍රේණිය | 174 |
| මාණ්ඩලික හෙද විශේෂ ශ්‍රේණිය (අධ්‍යාපන) | ශ්‍රී ලංකා හෙද සේවාවේ - විශේෂ ශ්‍රේණිය | 60 |
| මාණ්ඩලික හෙද විශේෂ ශ්‍රේණිය (මහජන සෞඛ්‍ය) නිලධාරිනීන් | ශ්‍රී ලංකා හෙද සේවාවේ - විශේෂ ශ්‍රේණිය | 4 |
| හෙද අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෙද විදුහල්පතිවරු | ශ්‍රී ලංකා හෙද සේවාවේ - විශේෂ ශ්‍රේණිය | 19 |
| අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන, හෙද මහජන සෞඛ්‍ය ,හෙද වෛද්‍ය සේවා) | ශ්‍රී ලංකා හෙද සේවාවේ විධායක ශ්‍රේණිය | 03 |

5.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

(අ) මාණ්ඩලික හෙද III, II, I හා අධි ශ්‍රේණිය - 20105

(ආ) මාණ්ඩලික හෙද I ශ්‍රේණිය (රෝහල් සේවා. හෙද අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) - 1078

(ඇ) විශේෂ ශ්‍රේණිය

(i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) - 238

(ii) හෙද අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෙද විදුහල්පතිවරුන් - 19

(ඈ) විධායක ශ්‍රේණිය

අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන, හෙද මහජන සෞඛ්‍ය , හෙද වෛද්‍ය සේවා) - 03

(රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම සංඛ්‍යාව වෙනස් විය හැක.)

06 බඳවා ගැනීමේ ක්‍රමය ඃ

6.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

6.2 සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම

6.2.1 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම.

වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 75% ක් අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ.තෝරාගනු ලබන අයදුම්කරුවන් පූර්ණකාලීන හෙද ඩිප්ලෝමා පාඨමාලාවට බඳවාගනු ඇත.(පුහුණු කාල සීමාව අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/10/2604/415/179 හා 2010.11.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පත්කළ කමිටුවේ නිර්දේශ මත තීරණය කරනු ඇත.) එලෙස බඳවා ගත් අයදුම්කරුවන් සිසු හෙද/හෙදියන් වශයෙන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා හෙද සේවයේ III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

විද්‍යාවේදී (හෙද) උපාධිය මත බඳවා ගැනීම.

6.2.2 වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% ක් විද්‍යාවේදී (හෙද) උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන මාස 06 ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගනු ලැබේ. පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා හෙද සේවයේ III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරෙ හි පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

6.2.3 සුදුසුකම්

6.2.3.1 අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

6.2.3.1.1 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව / ගණිතය / කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයන් 03කින් එකවර සමත් වීම;
සහ
සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රිසි යන විෂයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

6.2.3.1.2 විද්‍යාවේදී (හෙද) උපාධිය මත බඳවා ගැනීම

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් විද්‍යාවේදී (හෙද) උපාධිය සම්පූර්ණ කර තිබිය යුතුය.

6.2.3.2 කායික සුදුසුකම් -

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

ii. උස අඩි 04 අඟල් 10ට නොඅඩු විය යුතුය.
iii. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.2.3.3 වෙනත්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අවිවාහක විය යුතුය. විද්‍යාවේදී හෙද උපාධිය මත බඳවා ගන්නා අයදුම්කරුවන් සඳහා මෙය අදාළ නොවේ.
iii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iv. ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය.
v. බඳවා ගැනීමේ සංඛ්‍යාවෙන් 5% ක් පුරුෂ පක්ෂය සඳහා වේ. එසේ වුව ද සේවා අවශ්‍යතාව මත පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීමේ ප්‍රතිශතය 5% උපරිමයකට යටත්ව කලින් කලට වෙනස් කරනු ලැබිය හැකිය.
vi. සුදුසුකම් ලබන දිනය - ඉහත 6.2.3 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය

6.2.3.4 වයස

| | | |
|---|---|---|
| අවම සීමාව | - | අවුරුදු 18 |
| උපරිම වයස | - | අවුරුදු 28 |

6.2.4 බඳවා ගැනීමේ ක්‍රමය -

6.2.4.1 එක් වර්ෂයක අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම.

මෙහිදී බඳවා ගන්නා සංඛ්‍යාව සලකා බලන වර්ෂයේ ජීව, ගණිත හා කෘෂි විද්‍යා විෂය ධාරාවන්ගෙන් අයදුම් කරන සිසුන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා ඉන් අනතුරුව එම එක් එක් විෂය ධාරාවෙන් ඉහලම Z අගය ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් දිස්ත්‍රික් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ.

6.2.4.2 වර්ෂ දෙකක් (02) හෝ ඊට වැඩි වර්ෂ ගණනක අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම.

මෙහිදී බඳවා ගන්නා සංඛ්‍යාව එක් එක් වර්ෂයෙන් අයදුම් කරන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදනු ලැබේ. අනතුරුව එම එක් එක් වර්ෂය සඳහා බඳවා ගැනීමට නියමිත ප්‍රමාණය එම වර්ෂයේ අදාළ ජීව, ගණිත හා කෘෂි විද්‍යා විෂය ධාරාවන්ගෙන් අයදුම් කරන සිසුන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා ඉන් අනතුරුව ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් දිස්ත්‍රික් පදනම මත සුදුස්සන් තෝරා ගනු ලැබේ.

6.2.4.3 විද්‍යාවේදී (හෙද) උපාධිය මත බඳවා ගැනීම.

අදාළ අයදුම්කරුවන් සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න අඩංගු පැය 01ක ලිඛිත තරඟ විභාගයකට පෙනී සිටිය යුතු අතර ඉන් ඉහළම කුසලතාව ලබාගන්නා අයදුම්කරුවන් අනෙකුත් සියලුම සුදුසුකම් සපුරා තිබේනම් කුසලතා පදනම මත බඳවා ගනු ඇත. බඳවා ගැනීමේ සංඛ්‍යාවෙන් 5% ක් පුරුෂ පක්ෂය සඳහා වේ. එසේ වුවද සේවා අවශ්‍යතාව මත පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීමේ ප්‍රතිශතය 5% උපරිමයකට යටත්ව කලින් කලට වෙනස් කරනු ලැබිය හැකිය.

6.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු - බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

6.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා - සෞඛ්‍ය ලේකම්

සටහන : සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

6.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කිරීම මඟින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින්.

07. බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පුහුණුවට තෝරා ගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන හෙද විද්‍යාලක සිසු හෙද/හෙදියන් වශයෙන් තුන් අවුරුදු හෙද ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් ආයතනයකින් විද්‍යාවේදී හෙද උපාධිය ලබා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම

08. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| | කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|---|
| | 1 වැනි කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර | උපලේඛන i බලන්න. |
| | 2 වැනි කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර | උපලේඛන ii බලන්න. |
| | 3 වැනි කාර්යක්ෂමතා කඩඉම. | I වන ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර | උපලේඛන iii බලන්න |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ? වසරකට දෙවරක්.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා - සෞඛ්‍ය ලේකම්

09. භාෂා ප්‍රවීණතාව :

9.1

| *භාෂා ප්‍රවීණතාවය* | *ශ්‍රේණිය* | *ලබා ගතයුතු ප්‍රවීණතාවය* |
|---|---|---|
| 01. රාජ්‍ය භාෂාව | III | සේවයට බැඳී ඇත්තේ රාජ්‍ය භාෂාවකින් නොවේ නම් පරිවාස කාලය තුළ රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | III | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වැනි ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් -

(i) සේවයේ III වැනි ශ්‍රේණියේ පත්වීම් ස්ථිර කර තිබීම (තනතුරෙහි ස්ථිර කිරීමේ ලිපියක් නිකුත් කර තිබිය යුතු වේ.)
(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.
(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර දහයක් (10) තුල සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.
(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.
(vi) උසස්වීම දිනට පූර්වාසන්නම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම :

10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට හෙද සේවයේ II ශ්‍රේණියේ වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(iv) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 හෙද සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට හෙද සේවයේ I ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පූර්වාසන්න වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(iv) උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි හෙද සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය :
සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිළධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය

10.4 හෙද සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.4.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලය තුළදී නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) ජාතික හෙද අධ්‍යාපන ආයතනය/පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/මානසික හෙදකම අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.4.2 උසස් කිරීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව හෙද සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සටහන

(i) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 10.4.1 හි සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි I ශ්‍රේණියේ හෙද නිලධාරි ( අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) තනතුරට පත් වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨත්වය ද,හෙද සේවයේ I ශ්‍රේණියට පත් කිරීම සඳහා වන ජාතික හෙද අධ්‍යාපන ආයතනයේ/ පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේදී ඔවුන් විසින් ලබා ගත් කුසලතා අනුපිළිවෙළ ද, අදාළ පුරප්පාඩු සංඛ්‍යාවද අනුව පත් කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

(iii) සෑම වසරකම ජනවාරි 01 දිනට හා ජූනි 30 වන දිනට ඇතිවන විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව වසරකට දෙවරක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වා උසස්වීම් ලබා දෙනු ලැබේ.

(iv) විශේෂ ශ්‍රේණියට උසස් වූ යම් නිලධාරියකු 11.1.(ආ),(ඇ),(ඈ),(ඉ) යටතේ දැක්වෙන තනතුරකට පත් කිරීමෙන් පසු සති දෙකක් තුල අදාළ තනතුරේ සේවය සදහා වාර්තා නොකල හොත් අදාල නිලධාරියාගේ උසස් වීම අවලංගු වේ.

11. තනතුරුවලට පත් කිරීම්

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් |
|---|---|
| (අ) I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) | (i) II ශ්‍රේණියේ හෝ I ශ්‍රේණියේ හෝ අධි ශ්‍රේණියේ හෝ නිලධරයෙකු වීම.<br>(ii) ජාතික හෙද අධ්‍යාපන ආයතනය/ පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය /ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/මානසික හෙදකම අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වූ නිලධරයෙකු වීම.<br>(iii) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iv) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම |
| (ආ) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි ( අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) | (i) විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම<br>(ii) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම |
| (ඇ) විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) | (i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) නිලධරයකු වීම<br>(ii) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>(iv) හෙද ආචාරිණියක ලෙස ජාතික සෞඛ්‍ය විද්‍යායතනය මඟින් ලබාදෙන මාස 06ක පුහුණුව සම්පූර්ණ කර තිබීම. |
| (ඈ) ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනී | (i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) නිලධරයකු විය යුතුය.<br>(ii) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම. |

| තනතුර | සුදුසුකම් |
|---|---|
| (ඉ) හෙද විදුහල්පති | (i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) නිලධරයකු විය යුතුය.<br>(ii) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම. |
| (ඊ) අධ්‍යක්ෂ(හෙද වෛද්‍ය සේවා) | (i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරක සිටින නිළධාරියකු විය යුතු අතර අදාළ තනතුරේ යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම |
| (උ) අධ්‍යක්ෂ(හෙද මහජන සෞඛ්‍ය) | (i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරක සිටින නිළධාරියකු විය යුතු අතර අදාල තනතුරේ යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම |
| (ඌ) අධ්‍යක්ෂ(හෙද අධ්‍යාපන) | (i) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරක සිටින නිළධාරියකු විය යුතු අතර අදාල තනතුරේ යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම |

11.2 තෝරා ගනු ලබන ක්‍රමය

(අ) (1) I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා) තනතුරුවලට පත් කිරීම.

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 35%ක් පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන් අතරින් ඉහත 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. විභාගයේ විෂය නිර්දේශය උපලේඛණ iv මගින් දැක්වේ.

I. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
II. අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
III. වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම

ලිඛිත තරඟ විභාගයෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරාගනු ලබන අතර, ඉන් සමත් වූ නිලධාරීන් අතුරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත තනතුරුවලට පත්කිරීම සිදු කෙරේ.

ඉතිරි 65%ක පුරප්පාඩු ප්‍රමාණය පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ සිටින පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨත්වය, කුසලතාවය, යෝග්‍යතාවය, වැඩ හා හැසිරීම අනුව සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වන නිලධාරීන් අතරින් ඉහත 11.1 (අ)(ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබේ. උපලේඛණ v මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ.

I. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
II. අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
III. වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම

සටහන

(1) I ශ්‍රේණියේ හෙද නිලධාරි(රෝහල් සේවා) තනතුරේ ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව වසරකට වරක් ලිඛිත තරඟ විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(2) 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා නිලධාරීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

(3) 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා ලද නිලධාරියකු පුහුණුවෙන් අනතුරුව ඉහත 11.1(අ) හි දැක්වෙන තනතුරකට පත් කිරීමෙන් අනතුරුව සති දෙකක් තුල අදාළ තනතුරේ සේවයට වාර්තා කල යුතුය. එසේ තනතුර භාර නොගන්නා නිලධාරීන් හා පුහුණුව සාර්ථකව නිම නොකරන නිළධාරීන් ගිවිසුම් ගත මුදල ගෙවිය යුතු අතර ඔවුන් පෙර දැරූ තනතුරට යවනු ලැබේ.

(2) I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන,මහජන සෞඛ්‍ය) තනතුරුවලට පත් කිරීම.

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50%ක් පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන් අතරින් ඉහත 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. විභාගයේ විෂය නිර්දේශය උපලේඛණ iv මගින් දැක්වේ.

i. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම

ලිඛිත තරඟ විභාගයෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරාගනු ලබන අතර, ඉන් සමත් වූ නිලධාරීන් අතුරින් එක් එක් ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත තනතුරුවලට පත්කිරීම සිදු කෙරේ

ඉතිරි 50%ක පුරප්පාඩු ප්‍රමාණය පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ සිටින පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨත්වය, කුසලතාවය, යෝග්‍යතාවය, වැඩ හා හැසිරීම අනුව සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහත 11.1 (අ)(ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබේ. උපලේඛණ v මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ. ඉන් සමත් වන නිලධාරීන් අතරින් ඉතිරි 50%ක පුරප්පාඩු ප්‍රමාණය පුරවනු ලැබේ.

i. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ii. අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම

සටහන

(1) I ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන,මහජන සෞඛ්‍ය) තනතුරේ ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව වසරකට වරක් ලිඛිත තරඟ විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(2) 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා නිලධාරීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

(3) 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා ලද නිලධාරියකු පුහුණුවෙන් අනතුරුව ඉහත 11.1(අ) හි දැක්වෙන තනතුරකට පත් කිරීමෙන් අනතුරුව සති දෙකක් තුළ අදාල තනතුරේ සේවයට වාර්තා කල යුතුය. එසේ තනතුර භාර නොගන්නා හා පුහුණුව සාර්ථකව නිම නොකරන නිලධාරීන් ගිවිසුම් ගත මුදල ගෙවිය යුතු අතර ඔවුන් පෙර දැරූ තනතුරට යවනු ලැබේ.

(4) I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුර සඳහා අයදුම් කල හැක්කේ කාන්තා අයදුම්කරුවන්ට පමණි.

(ආ) විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී ( අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) තනතුරුවලට පත් කිරීම

ඉහත 11.1 හි (ආ) වගන්තියේ සඳහන් සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතරින් සුදුස්සන් තෝරනු ලැබේ.

සටහන : i. පත්වීම් ලබාදෙනුයේ මාණ්ඩලික හෙද I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන, රෝහල් සේවා , මහජන සෞඛ්‍ය) තනතුරට උසස් වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨත්වය ද ජාතික හෙද අධ්‍යාපන ආයතන/ පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙලද අදාළ පුරප්පාඩු සංඛ්‍යාව ද අනුවය.

ii. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරට පත්වූ නිලධාරීන් රජයේ පිළිගත් ආයතනයකින් මාස හයක (06) කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරිය යුතුය.

iii. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුරේ සෑම වසරකම ජනවාරි 01 දිනට හා ජූනි 30 වැනි දිනට ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව වසරකට දෙවරක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පුරප්පාඩු පුරවනු ලැබේ.

(ඇ) විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී(මහජන සෞඛ්‍ය) තනතුරට පත් කිරීම

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා I ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) නිලධාරීන් අතරින් ඉහත 11.1 (ඇ) (iv) හි දැක්වෙන හෙද ආචාරිණී පුහුණු පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. උපලේඛන vi මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ. ඉන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් ලකුණු ලබා ඇති කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මාස 06 හෙද ආචාරිණී පුහුණු පාඨමාලාව හැදෑරීමට තෝරාගනු ලබන අතර, පාඨමාලාව සාර්ථකව නිම කරන නිලධාරීන් අතුරින් අදාල ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත තනතුරුවලට පත්කිරීම සිදු කෙරේ.

(1) විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී(මහජන සෞඛ්‍ය) තනතුරේ ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව වසරකට වරක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(2) 11.1 (ඇ) (iv) හි දැක්වෙන පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා නිලධාරීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතුය.

(3) 11.1 (ඇ) (iv) හි දැක්වෙන පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා ලද නිලධාරියකු පුහුණුවෙන් අනතුරුව ඉහත 11.1(ඇ) හි දැක්වෙන තනතුරකට පත් කිරීමෙන් අනතුරුව සති දෙකක් තුල අදාල තනතුරේ සේවයට වාර්තා කල යුතුය. එසේ තනතුර භාර නොගන්නා නිලධාරීන් හා පුහුණුව සාර්ථකව නිම නොකරන නිලධාරීන් ගිවිසුම් ගත මුදල ගෙවිය යුතු අතර ඔවුන් පෙර දැරූ තනතුරට යවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරී

ඉහත 11.1 හි (ඈ) වගන්තියේ සඳහන් සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතරින් සුදුස්සන් තෝරනු ලැබේ.

සටහන : පත්වීම් ලබාදෙනුයේ මාණ්ඩලික හෙද I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨත්වය ද ජාතික හෙද අධ්‍යාපන ආයතන/ පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල ද අදාළ පුරප්පාඩු සංඛ්‍යාව ද අනුවය.

(ඉ) හෙද විදුහල්පති තනතුරට පත් කිරීම

ඉහත 11.1 හි (ඉ) වගන්තියේ සඳහන් සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුස්සන් තෝරනු ලැබේ. උපලේඛණ vii මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ.මෙම තනතුර ස්ථාන මාරු සහිත තනතුරක් නොවන අතර එක් හෙද විදුහලක විදුහල්පති ලෙස සේවය කරන නිලධාරියකුට තවත් හෙද විදුහලක විදුහල්පති තනතුරකට පත් විය හැක්කේ අදාල පුරප්පාඩුව ගැසට් කල පසු අයදුම් කිරීමෙන් පමණි.

(ඊ) අධ්‍යක්ෂ(හෙද වෛද්‍ය සේවා)

ඉහත 11.1 හි (ඊ) වගන්තියේ සඳහන් සුදුසුකම් හා පහත සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුස්සා තෝරනු ලැබේ. උපලේඛණ viii මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ.

(i) අදාළ කාලය තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(උ) අධ්‍යක්ෂ(හෙද මහජන සෞඛ්‍ය) තනතුරට පත් කිරීම

ඉහත 11.1 හි (උ) වගන්තියේ සඳහන් සුදුසුකම් හා පහත සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුස්සා තෝරනු ලැබේ. උපලේඛණ ix මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ

(i) අදාළ කාලය තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(ඌ) අධ්‍යක්ෂ(හෙද අධ්‍යාපන) තනතුරට පත් කිරීම

ඉහත 11.1 හි (ඌ) වගන්තියේ සඳහන් සුදුසුකම් හා පහත සුදුසුකම් සහිත විශේෂ ශ්‍රේණියේ නිලධරයන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුස්සා තෝරනු ලැබේ. උපලේඛණ x මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ

(i) අදාළ කාලය තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි අදාළ වේ.

13. (අ) සිසු හෙද පුහුණුව

(i) සිසු හෙද පුහුණුව දිවයින පුරා ඇති හෙද විදුහල්වල පවත්වනු ලැබේ.

(ii) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුල නියමිත විභාගයන් අසමත් වන හෝ අධ්‍යයන කටයුතු හා හැසිරීම අසතුටුදායක වන හෝ හෙද විද්‍යාලවල බල පැවැත්වෙන නීතිරීති මාලාව ප්‍රකාරව විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන්නා වූ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක අවසන් කළ හැකිය.

(iii) පුහුණු කාලය තුළ දී අවිවාහකව සිටිය යුතුය.

(iv) පුහුණුව ආරම්භ කිරීමට ප්‍රථමව රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(v) සාර්ථකව සිසු හෙද පුහුණුව නිම කරන සිසු හෙද / හෙදියෝ සේවාවේ III වැනි ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සඳහා පත් කිරීමට සුදුසුකම් ලබති.

(ආ) සේවාස්ථ පුහුණුව

වරින් වර පවත්වනු ලබන සේවාස්ථ පුහුණු මගින් වෘත්තීය දැනුම අඛණ්ඩව ලබාදෙනු ඇත. සේවයේ සියලු හෙද / හෙදියන්ගේ වෘත්තීය අභිවෘද්ධි අවශ්‍යතා මෙම පුහුණු පාඨමාලා මගින් ලබා දෙනු ඇත.

14. ගිවිසුම්

(1) අභ්‍යාසලාභීන් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් පසුව පවත්නා පුරප්පාඩු අනුව හෙද සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ලද හොත් අවුරුදු 10ක කාලයක් රජයට සේවය කරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

අදාල ගිවිසුම සිසු හෙද පුහුණුවට ඇතුළත්ව පළමු මාසය තුළ අත්සන් කළ යුතු අතර, පුහුණුව අතහැර යනු ලබන අභ්‍යාසලාභීන් ගිවිසුම් ගත මුදල (මෙම මුදල ලේකම් විසින් වරින් වර තීරණය කරනු ලැබේ.) හා එතෙක් ලබා ඇති දීමනා ආපසු ගෙවීම අනිවාර්යය වේ.

(2) සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන මාස 06ක අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගනු ලබන උපාධිධාරීන් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් පසුව පවත්නා පුරප්පාඩු අනුව හෙද සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ලද හොත් අවුරුදු 05ක කාලයක් රජයට සේවය කරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

(3) 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරි ( අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍ය) පුහුණුවට තෝරා ගන්නා ලද නිලධාරීයකු පුහුණුව සාර්ථකව නිම කරන බවට හා පුහුණුවෙන් අනතුරුව තනතුරකට පත් කිරීමෙන් පසු සති දෙකක් තුල අදාල තනතුරේ සේවයට වාර්තා කරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. ගිවිසුම් ගත මුදල ලේකම් විසින් වරින් වර තීරණය කරනු ලැබේ

(4) විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී(මහජන සෞඛ්‍යය) පුහුණුවට තෝරා ගන්නා ලද නිලධාරීයකු පුහුණුව සාර්ථකව නිම කරන බවට හා පුහුණුවෙන් අනතුරුව තනතුරකට පත් කිරීමෙන් පසු සති දෙකක් තුල අදාල තනතුරේ සේවයට වාර්තා කරන බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. ගිවිසුම් ගත මුදල ලේකම් විසින් වරින් වර තීරණය කරනු ලැබේ

15. නිර්වචන

(i) " ගැසට් පත්‍රය" යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

(ii) " නියමිත දිනය" යනුවෙන් අදහස් කරනුයේ සුදුසුකම් සම්පූර්ණ කරන ලෙස නියම කර ඇති දිනය වේ.

(iii) " සිසු හෙද / හෙදියන්" යනුවෙන් අදහස් කරනුයේ මෙම පරිපාටියේ විධිවිධාන යටතේ බඳවා ගනු ලබන සිසු හෙද පුහුණුව ලබමින් සිටින තැනැත්තෙකි.

(iv) හෙද / හෙදි නිලධාරියා - අඛණ්ඩ හෙද ඩිප්ලෝමා පාඨමාලාවක් රජයේ හෙද විද්‍යාලකින් හදාරා අවසන් පරීක්ෂණය සමත්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව/ ශ්‍රී ලංකා හෙද සභාව තුළ ලියාපදිංචිය ලත් පුද්ගලයා.

(v) සක්‍රීය සේවා කාලය යනුවෙන් අදහස් කරනුයේ ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරීය හි යෙදී සිටි සේවා කාලය වේ.රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණන කරනු නොලබන්නේය.

(vi) " මාණ්ඩලික හෙද" යනුවෙන් අදහස් කරනුයේ සිසු හෙද / හෙදියන් නොවන අතර, රජයේ හෙද විද්‍යාලකින් හෙද ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් පරීක්ෂණයෙන් සමත්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව / ශ්‍රී ලංකා හෙද සභාව තුළ ලියාපදිංචිය ලත් නිලධාරියකු / නිලධාරිණියක වේ. මෙය හුදෙක්ම තනතුරු නාමයක් පමණක් වන අතර, එයින් මාණ්ඩලික ශ්‍රේණිය යන්න අර්ථ නොදක්වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 වැටුප් චක්‍රලේඛයේ සඳහන් වන පරිදි අධීක්ෂණ කාර්යයන් පවරනු ලැබී ඇති ද්වීතිය මට්ටමේ තනතුරු ද තෘතීය මට්ටමේ හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියලු තනතුරු ද මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වේ.

(vii) " ලේකම්" යනුවෙන් අදහස් කරනු ලබන්නේ සෞඛ්‍ය විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

16. තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ දී යම් වර්ෂයක දී බඳවා ගත යුතු සංඛ්‍යාව වනුයේ එම වර්ෂයේ ජූනි 30 දිනට එම ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

17. බඳවා ගැනීම හා ශ්‍රේණිගත උසස්වීම් සිදු කිරීම.

සේවයට / තනතුරුවලට බඳවා ගැනීම, පත් කිරීම හා ශ්‍රේණිගත උසස් කිරීම් මෙම පරිපාටියේ දක්වා ඇති ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතුය.

18. තනතුරට පත් කිරීමේ බලධාරියා -

(අ) ශ්‍රී ලංකා හෙද සේවයේ I ශ්‍රේණිය (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය)
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

(ආ) ශ්‍රී ලංකා හෙද සේවයේ විශේෂ ශ්‍රේණිය (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය)
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ඇ) අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන, හෙද මහජන සෞඛ්‍ය ,හෙද වෛද්‍ය සේවා)
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

19. අන්තර්ග්‍රහණය කිරීම ඃ

19.1 (අ) නියමිත දින වන විට සේවයේ නියුතු නිලධාරීන් ප්‍රතිසංවිධිත ශ්‍රී ලංකා හෙද සේවයට අන්තර්ග්‍රහණය කිරීම පහත සඳහන් ආකාරයට සිදු කරනු ලැබේ ඃ-

(i) සේවයේ II ආ ශ්‍රේණියේ නිලධාරීන් නව ව්‍යවස්ථාවේ III වැනි ශ්‍රේණියට
සේවයේ II අ ශ්‍රේණියේ නිලධාරීන් නව ව්‍යවස්ථාවේ II ශ්‍රේණියට

(ii) සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නව ව්‍යවස්ථාවේ I ශ්‍රේණියට

(iii) සේවයේ I ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා I ශ්‍රේණියට නියමිත වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට

(iv) සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල සිටින නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ
( අධ්‍යාපන, රෝහල් සේවා, මහජන සෞඛ්‍යය) තනතුරුවලට .

අන්තර්ග්‍රහණය ශ්‍රේණි කොට ගෙන නියමිත දින දී අදාල පංතිවල / ශ්‍රේණිවල ඒ ඒ නිලධාරීන් හට හිමි ව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් සිදු නොවනු ඇත.

19.2 සේවයට අන්තර්ග්‍රහණය කිරීම මත නිලධාරීන්ගේ අදාළ වැටුප

නියමිත දිනට පැවැති ව්‍යවස්ථාව යටතේ II වැනි පංතියේ "ආ " ශ්‍රේණියේ සිටින නිලධාරියෙකු නව III වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම හෝ II වැනි පංතියේ "අ" ශ්‍රේණියේ සිටින නිලධාරියෙකු II වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය මත හෝ I වැනි ශ්‍රේණියේ සිටින නිලධාරියෙකු නව I වැනි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වීම මත හෝ විශේෂ ශ්‍රේණියේ සිටින නිලධාරියෙකු විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වීම මත හෝ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ

20. අන්තර්කාලීන විධිවිධාන

අන්තර් කාලය 2010.11.01 දින සිට 2016.01.01 දක්වා වේ. 2016.01.01 න් පසු නව ව්‍යවස්ථාවේ විධිවිධාන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වේ. අන්තර් කාලය තුළදී පහත පරිදි කටයුතු කරනු ලැබේ.

20.1. කාර්යක්ෂමතා කඩඉම්

20.1.1 පළමු කාර්යක්ෂමතා කඩඉම.

II "ආ" ශ්‍රේණියේ හෙද නිළධාරී ලෙස සේවයට බඳවා ගන්නා ලද හෝ III ශ්‍රේණියේ හෙද නිළධාරීන් ලෙස සේවයට බඳවා ගන්නා ලද හෝ III ශ්‍රේණියේ හෙද නිළධාරී ලෙසට අන්තර්ග්‍රහණය කර ඇති හෙද නිළධාරීන් පළමු පත්වීම් දින සිට වසර 03 ක් තුළ (පරිවාස කාලය තුළ) පළවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය යන විධි විධානය අන්තර්කාලය තුළදී ද එලෙසම ක්‍රියාත්මක කෙරේ

20.1.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම.

20.1.2.1. II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර ඇති හෝ උසස් කර ඇති හෙද නිළධාරීහු මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

20.1.2.2. 2010.11.01 දිනට පැරණි සේවා ව්‍යවස්ථාවේ II (අ) ඛණ්ඩයේ වසර 06 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ හෙද නිළධාරීන් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

20.1.2.3. අනෙකුත් සියලුම II ශ්‍රේණියේ හෙද නිළධාරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම අනිවාර්ය වන අතර ඔවුන්ට ඒ සඳහා මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2010.11.01 දින හෝ II ශ්‍රේණියට උසස් වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වසර 3ක සහන කාලයක් ලබා දෙනු ලැබේ.

20.1.2.4. අන්තර් කාලය තුළදී මුල් පත්වීමේ දින සිට වසර 5 ක සක්‍රීය සේවා කාලයක් සපුරාලන හා පැරණි හෙද සේවා ව්‍යවස්ථාව අනුව II (අ) ඛණ්ඩයට උසස්වීමට අවශ්‍ය අනෙකුත් සියලුම සුදුසුකම් සපුරාලන හෙද නිළධාරීන් වේ නම් ඔවුන් II ශ්‍රේණියට උසස් කිරීමෙන් අනතුරුව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති. ඔවුන්ට උසස්වීම් ප්‍රදානය කළ ලිපියේ සඳහන් දින සිට වසර 3 ක් දක්වා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමට සහන කාලයක් ලබා දෙනු ලැබේ.

20.1.3. තෙවන කාර්යක්ෂමතා කඩඉම.

20.1.3.1 I ශ්‍රේණියේ හෙද නිළධාරී (රෝහල් සේවා/අධ්‍යාපන/මහජන සෞඛ්‍ය) තනතුරුවල සිටින නිළධාරීන් සහ I ශ්‍රේණියට උසස් වූ හෝ අන්තර්ග්‍රහණය වූ නිළධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

20.1.3.2. I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෙද නිළධාරීන් අතුරින් 2010.11.01 දිනට I ශ්‍රේණියේ වසර 05 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන ලද හෙද නිළධාරීන් 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. එසේම පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල (ජාතික හෙද අධ්‍යාපන ආයතනය) හි වසර 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා I ශ්‍රේණියේ හෙද නිළධාරී (රෝහල් සේවා/අධ්‍යාපන/මහජන සෞඛ්‍ය) තනතුරු වල සිටින හෙද නිළධාරීන් ද 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

20.1.3.3. I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ හෙද නිළධාරීන් අතරින් 2010.11.01 දිනට I ශ්‍රේණියේ වසර 5 කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත හෙද නිළධාරීන්ට 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2010.11.01 දින හෝ I ශ්‍රේණියට උසස් වූ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වසර 5 ක සහන කාලයක් ලබා දෙනු ලැබේ.

20.1.3.4. 2010.11.01 දිනෙන් පසුව 1 ශ්‍රේණියට උසස් වීම් ලබන සියලුම නිළධාරීන් 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය යුතුය.

20.2 ශ්‍රේණිගත උසස්වීම

20.2.1. III ශ්‍රේණියට බඳවා ගැනීම.

නව හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව සිදු කෙරේ.

20.2.2. III ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

අන්තර්කාලය තුළදී III ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලයක් සපුරාලන හා පැරණි හෙද සේවා ව්‍යවස්ථාව අනුව අවශ්‍ය අනෙකුත් සියලුම සුදුසුකම් සපුරාලන හෙද නිළධාරීන් වේ නම් ඔවුන් වසර 05ක සේවා කාලය සපුරාලන දිනය හෝ අවශ්‍ය අනෙක් සුදුසුකම් සපුරාලන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. අන්තර්කාලය ඉක්ම ගිය පසු සුදුසුකම් සපුරාලන නිළධාරීන්ට උසස්වීම් ලබාදෙනුයේ නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලවය. මෙහිදී පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ වූ II (ආ) ඛණ්ඩයේ සේවා කාලය නව සේවා ව්‍යවස්ථාවේ III ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ

20.2.3. II ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

අන්තර්කාලය තුළදී II ශ්‍රේණියේ වසර 10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කරන නිළධාරීන් I ශ්‍රේණියට උසස් කරනු ලැබේ. මෙහිදී පැරණි සේවා ව්‍යවස්ථාව යටතේ වූ II (අ) ඛණ්ඩයේ සේවා කාලය නව සේවා ව්‍යවස්ථාවේ II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ. අන්තර්කාලය ඉක්ම ගිය පසු නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව උසස්වීම් ලබාදෙනු ලැබේ. යම් නිළධාරියෙකු II ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සම්පූර්ණ කරන දිනය 2010.11.01 දිනට පෙර දිනයක් වුවහොත් එම නිළධාරීන් I ශ්‍රේණියට උසස් කරනුයේ 2010.11.01 දින සිටය.

20.3 . තනතුරුවලට පත්කිරීම.

20.3.1. I ශ්‍රේණියේ හෙද නිළධාරී (රෝහල් සේවා/මහජන සෞඛ්‍ය / අධ්‍යාපන) තනතුරුවලට පත්කිරීම.
නව හෙද සේවා ව්‍යවස්ථාවේ විධි විධානවලට අනුකූලව සිදු කරනු ලැබේ. I ශ්‍රේණියේ හෙද නිළධාරී (අධ්‍යාපන) හා I වන ශ්‍රේණියේ හෙද නිළධාරී (මහජන සෞඛ්‍ය) බඳවාගනු ලබන්නේ තරග විභාගයෙන් පමණි.

I වන ශ්‍රේණියේ හෙද නිළධාරී (රෝහල් සේවා) තනතුරුවලට 35% සීමිත ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මතත් 65% II ශ්‍රේණියේ , I වන ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ සිටින හෙද නිළධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨත්වය මත තෝරාගනු ලැබේ.

20.3.2. විශේෂ ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීම.

අන්තර්කාලය තුළදී ඉහත 20.1.3.හි සඳහන් විධිවිධානයන්ට යටත්ව මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සිදු කරනු ලැබේ.

21. මෙම ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාව 2010.11.01 දින සිට ක්‍රියාත්මක වේ.

22. මෙම ව්‍යවස්ථාවේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතාවයන් හා නිපුණතාවයන් ද සියලුම නිළධාරින් විසින් නියමිත පරිදි ලබාගත යුතුය.

ශ්‍රී ලංකා හෙද සේවයේ සියලුම නිළධාරීන් රජයේ පොදු නියෝගවලට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට,රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසිවලට හා කලින් කලට බලපවත්නා රජයේ පොදු රෙගුලාසිවලට යටත් වේ.

සංලක්ෂ්‍යය -මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. මෙම ව්‍යවස්ථාවේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

*උපලේඛනය I*

හෙද සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරින් සඳහා පැවැත්වෙන I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

01. තනතුරට බඳවා ගැනීමට පෙර සිසු හෙද / හෙදියක් වශයෙන් වන පුහුණුවට ඉල්ලුම්කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ.
02. තනතුරේ III වන ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.
03. සියලු විෂයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට අවසර ඇත.
04. සාමාර්ථය සඳහා එක් එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40%ක් ලබාගත යුතුය.
05. මෙම විභාගය පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

ආයතන සංග්‍රහය - පැය තුනක (03) ප්‍රශ්න පත්‍රයකි. ලකුණු 100කි.
මෙහිදී රචනාමය ප්‍රශ්න 08ක් ලබා දෙන අතර, ඉන් 05ක් සඳහා අපේක්ෂකයා පිළිතුරු සැපයිය යුතුය.

මුදල් රෙගුලාසි - පැය තුනක (03) ප්‍රශ්න පත්‍රයකි. ලකුණු 100කි.
මෙහිදී රචනාමය ප්‍රශ්න 08 ක් ලබා දෙන අතර, ඉන් 05ක් සඳහා අපේක්ෂකයා පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය

(I) ආයතන සංග්‍රහය
ආයතන සංග්‍රහයේ පරිච්ඡේද ii, iii, vii, viii, xii, xiii, xvii, xxii, xxv යටතේ ඇතුළත් කරුණු පිළිබඳව දැනුම පරීක්ෂා කරන ලිඛිත ප්‍රශ්න පත්‍රයකි.

(II) මුදල් රෙගුලාසි
මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 1 සිට මු.රෙ. 157 දක්වා කරුණු පිළිබඳව පරීක්ෂා කරන ලිඛිත ප්‍රශ්න පත්‍රයකි.

*උපලේඛනය II*

හෙද සේවයේ *II* වැනි ශ්‍රේණියේ නිලධාරින් සඳහා පැවැත්වෙන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

01. තනතුරට බඳවා ගැනීමට පෙර සිසු හෙද / හෙදියක් වශයෙන් වන පුහුණුවට ඉල්ලුම්කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ.
02. තනතුරේ II වන ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.
03. සියලු විෂයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට අවසර ඇත.
04. සාමාර්ථය සඳහා එක් එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40%ක් ලබාගත යුතුය.
05. මෙම විභාගය පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

(i) හෙදකම පිළිබඳ න්‍යායාත්මක දැනුම - පැය 03 ලකුණු 100 යි
(ii) වාට්ටු කළමනාකරණය - පැය 03 ලකුණු 100 යි

විෂය නිර්දේශය

(I) හෙදකම පිළිබඳ න්‍යායාත්මක දැනුම
ශල්‍ය හෙදකම
වෛද්‍ය හෙදකම
ළමා හෙදකම

(II) වාට්ටු කළමනාකරණය
රෝගී සාත්තු කළමනාකරණය
පංචවිධ සංකල්පය
ක්‍රියාකාරී සැලැස්ම - මාසිකව /වාර්ෂික

*උපලේඛනය III*

හෙද සේවයේ I වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන තෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

01. තනතුරට බඳවා ගැනීමට පෙර සිසු හෙද / හෙදියක් වශයෙන් වන පුහුණුවට ඉල්ලුම්කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ.
02. තනතුරේ I වන ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති. පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාලේ වසර 1 ½ ක පුහුණුව ලබා I ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරට පත්වීම් ලබා සිටින නිලධාරීන් මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ
03. සියලු විෂයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට අවසර ඇත.
04. සාමාර්ථය සඳහා එක් එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40%ක් ලබාගත යුතුය.
05. මෙම විභාගය පහත පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් (02) සමන්විත වේ.

1. පොදු කළමනාකරණය - පැය 03 ලකුණු 100 යි
2. පොදු හෙදකම - පැය 03 ලකුණු 100 යි

විෂය නිර්දේශය

01. පොදු කළමනාකරණය
    - රෝගී සාත්තු සැලැස්ම
    - කාර්ය මණ්ඩල සුපරීක්ෂණය හා අධීක්ෂණය
    - වගකීමක් සහිතව කාර්ය පැවරීම - Delegation
    - නායකත්වය - Leadership
    - මානව සම්පත් කළමනාකරණය

02. පොදු හෙදකම
    - ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය (කරුණු 17 ට අදාළව)
    - රෝග නිවාරණය හා සෞඛ්‍ය ප්‍රවර්ධනය
    - අධ්‍යාපන විද්‍යා මූලධර්ම
    - හෙද පර්යේෂණ මූලධර්ම
    - වාට්ටු පරිපාලනය
    - සන්නිවේදනය
    - කණ්ඩායම් සංකල්පය
    - කාර්ය මණ්ඩල සංවර්ධන

*උපලේඛනය IV*

විභාගය පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :

මාණ්ඩලික හෙද I වැනි ශ්‍රේණියේ නිලධාරීන් (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) වශයෙන් පත් කිරීම සඳහා පුහුණුවට තෝරා ගැනීම.

02. විභාගය පිළිබඳ විස්තර - ක්ෂේත්‍ර තුන (03) සඳහා විභාග තුනකි (03)

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* | |
|---|---|---|---|---|
| සරල වාක්‍ය රචනය | පැය 01 | 100% | 40% | |
| හෙදකම පිළිබඳ කාලීන ප්‍රවණතා | පැය 02 | 100% | 40% | |
| ඉංග්‍රීසි භාෂාව | පැය 01,1/2 | 100% | 40% | I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී(අධ්‍යාපන) තනතුරට අයදුම් කරන නිලධාරීන්ට පමණක් අදාල වේ |

03. විභාගය පවත්වනු ලබන නිලධාරියා : ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : පවත්නා පුරප්පාඩු අනුව අවශ්‍යතාවය පරිදි සෞඛ්‍ය ලේකම් විසින් තීරණය කරනු ඇත

.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සරල වාක්‍ය රචනය | මෙම ප්‍රශ්න පත්‍රය සඳහා වාක්‍ය රචනයක් ලිවීම ඇතුළත් වේ. |
| හෙදකම පිළිබඳ කාලීන ප්‍රවණතා | කාලීන වශයෙන් හෙද නිලධාරියකු විසින් පොදු හෙදකම පිළිබඳව ලබා තියෙන දැනුම පරීක්ෂා කර බැලීම. |
| ඉංග්‍රීසි භාෂාව | අ.පො.ස (සා/පෙල) මට්ටමේ ප්‍රශ්න පත්‍රයකි |

*උපලේඛනය V*

හෙද සේවාවේ I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) ලෙස පත් කිරීම සඳහා වන පුහුණුවට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා වන ලකුණු දීමේ පටිපාටිය

| | | | | |
|---|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨතාවය | | - | උපරිම ලකුණු 80 |
| | හෙද සේවයේ II, I හා අධි පංතියේ සෑම වසරක් සඳහාම ලකුණු 08 බැගින් | | | |
| 02. | කුසලතාවය | | - | උපරිම ලකුණු 20 |
| | (i) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද උපාධියක් සඳහා | - | ලකුණු 05 |
| | (ii) | සෞඛ්‍ය ලේකම් විසින් පිළිගනු ලබන ආයතනයකින්, විෂය ක්ෂේත්‍රයට අදාලව ලබාගත් ඩිප්ලෝමාවක් සඳහා | - | ලකුණු 03 |
| | (iii) | විශේෂ ක්‍රියාකාරකම් | - | ලකුණු 12 |
| | | (සෑම විශේෂ ක්‍රියාකාරකමක් සඳහාම ලකුණු 02 බැගින් ලබා දෙන අතර, අදාල ක්ෂේත්‍රයට අදාලව ලකුණු ලබා දිය යුතු විශේෂ ක්‍රියාකාරකම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත. | | |
| | | එකතුව | - | ලකුණු 100 |

*උපලේඛනය VI*

හෙද සේවාවේ විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී ( මහජන සෞඛ්‍ය) ලෙස පත් කිරීම සඳහා වන සය මාසික පුහුණුවට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා වන ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය | | උපරිම ලකුණු 80 |
| 1 ශ්‍රේණියේ හෙද නිලධාරී(මහජන සෞඛ්‍ය) තනතුරක වසර 07 කට පසු සේවය සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් | | |
| 02. කුසලතාවය | | උපරිම ලකුණු 20 |
| (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද උපාධියක් සඳහා | ලකුණු 05 | |
| (ii) පුහුණු මධ්‍යස්ථානයක සේවය සඳහා වසරකට ලකුණු 02 බැගින් | ලකුණු 06 | |
| (iii) කාර්ය සාධන ඇගයීම් සඳහා<br>විශිෂ්ට - 09<br>සාමාන්‍ය මට්ටමට වැඩි - 07<br>සාමාන්‍ය -05<br>කාර්ය සාධන ඇගයීම් වලට අදාලව ලබා දිය යුතු ලකුණු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත. | ලකුණු 09 | |
| එකතුව | | ලකුණු 100 |

*උපලේඛනය VII*

හෙද විදුහල්පති ලෙස පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා වන ලකුණු දීමේ පටිපාටිය

| | | |
|---|---|---|
| 1. විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨත්වයට | - | (ලකුණු 50) |
| 2. හෙද විදුහල්පති තනතුරේ පළපුරුද්ද සඳහා | - | (ලකුණු 20) |
| 3. විශේෂ කුසලතාවයන් සඳහා | - | (ලකුණු 10) |
| 4. වෘත්තීය සුදුසුකම් සඳහා | - | ( ලකුණු 15) |
| 5. සම්මුඛ පරීක්ෂණ සඳහා | - | (ලකුණු 05) |
| එකතුව | - | ( ලකුණු 100) |

සටහන :

(1) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී ඉහත වගුවෙ හි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය

*උපලේඛනය VIII*

අධ්‍යක්ෂ(හෙද වෛද්‍ය සේවා) ලෙස පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා වන ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01. | හෙද සේවයේ (රෝහල් සේවා) විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨත්වයට | - | ලකුණු 30 |
| 02. | හෙද සේවයේ (රෝහල් සේවා ) පළපුරුද්ද සඳහා | - | ලකුණු 30 |
| 03. | ක්ෂේත්‍රයට ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 25 |
| 04. | ක්ෂේත්‍රයට අදාල වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා | - | ලකුණු 10 |
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි කුසලතා නායකත්වය,ආකල්ප, පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා | - | ලකුණු 05 |
| | එකතුව | - | ලකුණු 100 |

සටහන :

බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී ඉහත වගුවෙ හි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

*උපලේඛනය IX*

අධ්‍යක්ෂ(හෙද මහජන සෞඛ්‍ය) ලෙස පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා වන ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01. | හෙද සේවයේ (මහජන සෞඛ්‍ය) විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨත්වයට | - | ලකුණු 30 |
| 02. | හෙද සේවයේ (මහජන සෞඛ්‍ය) පළපුරුද්ද සඳහා | - | ලකුණු 30 |
| 03. | ක්ෂේත්‍රයට ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 25 |
| 04. | ක්ෂේත්‍රයට අදාල වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා | - | ලකුණු 10 |
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි කුසලතා නායකත්වය,ආකල්ප, පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා | - | ලකුණු 05 |
| | එකතුව | - | ලකුණු 100 |

සටහන :

බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී ඉහත වගුවෙ හි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

*උපලේඛනය X*

අධ්‍යක්ෂ(හෙද අධ්‍යාපන) ලෙස පත් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා
වන ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01. | හෙද සේවයේ (අධ්‍යාපන)) විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨත්වයට | - | ලකුණු 30 |
| 02. | හෙද සේවයේ (අධ්‍යාපන) පළපුරුද්ද සඳහා | - | ලකුණු 30 |
| 03. | ක්ෂේත්‍රයට ඇතුළත් අධ්‍යාපන සුදුසුකම් | - | ලකුණු 25 |
| 04. | ක්ෂේත්‍රයට අදාල වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා | - | ලකුණු 10 |
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි කුසලතා<br>නායකත්වය,ආකල්ප, පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා | - | ලකුණු 05 |
| | එකතුව | - | ලකුණු 100 |

සටහන :

බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී ඉහත වගුවෙ හි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් රාජ්‍ය සේවා සේවා කොමිෂන් සභාව වෙතින් අනුමත කරවා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් විසින් කටයුතු කළ යුතුය.

12-59

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.